**මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව**
**මුලතිව් දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 13 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ඔක්තෝබර් 05 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඒවා විගණනයට ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතුව තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදීත් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට සභාව විසින් කටයුතු කළ යුතුය. | සභාවේ 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වික්‍රමනායක උපචිත ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව පිළියෙල කර ඇති අතර 2020 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සෑම සංරචකයටම ගිණුම්කරණ ප්‍රතිපත්තිය සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා උපයෝගී කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියේදි හෙළිදරව් කරනු ලැබේ. |

**(ආ) ප්‍රමාණාත්මක ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතු වාහන 17ක වටිනාකම තක්සේරු කර පසුගිය වර්ෂ 01 සිට 03ක් දක්වා කාලයක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබූ නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එහි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වාහනවල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2020 වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | කාර්යාල උපකරණ 2330ක වටිනාකම එකතුව රු.3,385,092ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවිකිරීම් ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවි කිරීම් වටිනාකම රු.3,385,092කින් වැඩියෙන් සහ කාර්යාල උපකරණ වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේ උක්ත සඳහන් අඩුපාඩු නිවැරදි කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ. |
| (iii) | පිරියත හා යන්ත්‍රෝපකරණ වටිනාකම එකතුව රු.397,000ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවිකිරීම් ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවි කිරීම් වටිනාකම රු.397,000කින් වැඩියෙන් දක්වා තිබූ අතර යන්ත්‍රෝපකරණ වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේ උක්ත සඳහන් අඩුපාඩු නිවැරදි කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ. |
| (iv) | පරිගනක හා පරිගනක උපාංග 42ක වටිනාකම එකතුව රු.364,380ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවිකිරීම් ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවි කිරීම් වටිනාකම රු. 364,380කින් වැඩියෙන් දක්වා තිබූ අතර එලෙසම පරිගනක හා පරිගනක උපාංග වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේ උක්ත සඳහන් අඩුපාඩු නිවැරදි කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ. |
| (v) | කාර්යාල උපකරණ 786ක වටිනාකම එකතුව රු.3,004,330ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල පිරියත හා යන්ත්‍රෝපකරණ ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල පිරියත හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු.3,004,330කින් වැඩියෙන් සහ කාර්යාල උපකරණ වටිනාකම එම අගයෙන් අඩුවෙනුත් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | නියමිත ඡේදවල අනාවරණය කර තිබූ නිරීක්ෂණයන් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. |
| (vi) | පරිගනක හා පරිගනක උපාංග 80ක වටිනාකම එකතුව රු.2,341,465ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල පිරියත හා යන්ත්‍රෝපකරණ ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල පිරියත හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු.2,341,465කින් වැඩියෙන් සහ පරිගනක හා පරිගනක උපාංගවල වටිනාකම එම අගයෙන් අඩුවෙනුත් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | නියමිත ඡේදවල අනාවරණය කර තිබූ නිරීක්ෂණයන් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (vii) | කාර්යාල රථවාහන 03ක වටිනාකම එකතුව රු.44,580ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල පිරියත හා යන්ත්‍රෝපකරණ ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල පිරියත හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු.44,580කින් වැඩියෙන් සහ කාර්යාල රථවාහනවල වටිනාකම එම අගයෙන් අඩුවෙනුත් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | නියමිත ඡේදවල අනාවරණය කර තිබූ නිරීක්ෂණයන් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් සභාවට ලැබී තිබූ 2017 වර්ෂය සඳහා වූ මුද්දර ගාස්තු එකතුව රු.3,896,185ක් පසුගිය වර්ෂ 03ක කාලය පුරා සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබුණි. | ආදායම් පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය කාර්යක්ෂම කිරීමටත්, මෙම ආදායම නියමිත පරිදි ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමටත් ක්‍රියාමාර්ගයන් සභාව විසින් ගත යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම්, ගොඩනැගිලි, ළිං, ණයගැතියන් සහ වියදම් ණයහිමියන් ගිණුම් ශේෂ එකතුව රු. මිලියන 224.72කට අදාල ඉඩම් හිමිකම් ඔප්පු, මිනින්දෝරු ඡායාරූප සහ වටිනාකම් තක්සේරු සහතික, ඓතිහාසික පිරිවැය පත්‍රිකා, කාර්යය ලිපිගොනු සහ ශේෂ සනාථ කිරීම් ආදිය විගණනයට නොලැබීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පිළිගෙන සනාථ කළ නොහැකි විය. | අනාවරණය කර ඇති ලිඛිත ලේඛන ලබාගෙන නියමිත පරිදි ගොනුගත කිරීමට සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉඩම් සඳහා ඉඩම් හිමිකම් ඔප්පු ලබාගැනීමේ කටයුතු සිදුකෙරෙමින් පවති. අනුමැතිය ලැබූ වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. ගොඩනැගිලි සඳහා වටිනාකම අලුතින් තක්සේරු කළ යුතුව පවතින බැවින් ඉදිරියේදී අඛණ්ඩව කටයුතු කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති පොදු ළිං පිළිබඳ ලේඛන විගණනය සඳහා ප්‍රවර්තන වර්ෂයේදි ඉදිරිපත් කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | III පරිච්ඡේදය 24 වගන්තිය | සභාවට අයත් මාර්ග සහ මංමාවත්වල ලැයිස්තු | සභාවේ අනුමැතිය ලබා සභා බල ප්‍රදේශයට අයත් සියළුම මාර්ග | කඩිනමින් රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට |

| | | | | |
|---|---|---|---|---|
| | | පිළියෙල කර රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට මේ දක්වා කටයුතු කර තිබුණි. | සහ මංමාවත්වල ලැයිස්තු පිළියෙල කර රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට සභාව විසින් නියමිත කාලයේදි ක්‍රියාමාර්ග යුතු වේ. | කටයුතු කෙරේ. |
| (ii) | III පරිච්ඡේදය 33 වගන්තිය | වරිපනම් බදු සම්බන්ධයෙන් සමීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නියමිත කාලයේදි සභාව විසින් ගෙන නොතිබුණි. | වරිපනම් බදු තක්සේරු කිරීම් අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් නියමිත කාලයේදි සිදු කළයුතු වේ. | මේ පිළිබඳව අඛණ්ඩ ක්‍රියාමාර්ග කඩිනමින් ගනු ලැබේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 110 | පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි | ලේඛන, මේ දක්වා යාවත්කාලින කර පවත්වාගෙන යාමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේ සිට නඩත්තු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | මුදල් රෙගුලාසි 454(2) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය නඩත්තු කිරීමට සභාව විසින් ගත යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේ සිට නඩත්තු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (iii) | මුදල් රෙගුලාසි 571 | කොන්ත්‍රාත්කරුවන් 14දෙනෙකු විසින් සිදුකර තිබූ කොන්ත්‍රාත් කාර්යයන් 16ක් වෙනුවෙන් ඇප තැන්පතු, ආපසු ගෙවිය යුතු ලංසු ඇප තැන්පතු 07ක්, කුලී තැන්පතුවක් ආදියෙහි එකතුව රු.1,378,184ක් සම්බන්ධයෙන් නියමිත ක්‍රියාමාර්ග සභාව විසින් සිදු නොකර පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 04 ක කාලයක් පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | කාලය ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් පරිශීලනය කර නියමිත කාලයේදි ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුය. | එකතුව රු.305,623ක් වටිනා තැන්පතු 04ක් ආපසු ගෙවා ඇත. රු.1,072,561ක් වටිනා තැන්පතු ආපසු ගෙවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (iv) | මුදල් රෙගුලාසි 770 සහ 771 | සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව ප්‍රකාරව සිදු කළ යුතුව තිබූ පසු විපරම් කටයුතු කිසිවක් සභාව විසින් සිදු කර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පිළිබඳ කටයුතු අවසන් කිරීමේ ක්‍රියාමාර්ග සභාව විසින් නියමිත කාලයේදි ගත යුතු වේ. | රටෙහි පැවැති අහිතකර තත්ත්වය හේතුවෙන් පසුවිපරම් කටයුතු සිදුකළ නොහැකිව පැවතුණි. ඉදිරි දිනවලදි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (v) | මුදල් රෙගුලාසි 845(1) | රාජකාරි දුරකථන ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | රාජකාරි දුරකථන ලේඛනයක් නියමිත පරිදි නඩත්තු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගතයුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ සිට නඩත්තු කිරිමට කටයුතු කරනු ලැබේ. |
| (vi) | මුදල් රෙගුලාසි 891(1) | ඇප ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | ඇප ලේඛනය අඛණ්ඩව නියමිත පරිදි නඩත්තු කිරිමට ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේ සිට නඩත්තු කිරිමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | ප්‍රසම්පාදන අත්පොතේ 5.4.12 මාර්ගෝපදේශය | එකතු කළ අගය මත බදු මුදල් ගෙවූ පසු එහි තොරතුරු ඊලඟ මාසයේ 15 දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාටත් එහි පිටපතක් විගණකාධිපතිවරයාටත් යවා නොතිබුණි. | අදාල කැලැන්ඩර් මාසයේ ගෙවිය යුතු එකතු කළ අගය මත බදු පිළිබඳව විස්තර ඊළඟ කැලැන්ඩර් මාසයේ 15 දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට යවා එහි පිටපතක් විගණකාධිපතිවරයාටත් ඉදිරිපත් කිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ප්‍රවර්තන වර්ෂයේ සිට නියමිත කාල පරිච්ඡේදය තුළ යැවීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | | |
| (i) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502(2) | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර යාවත්කාලීන කිරිමට අවශ්‍ය ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේ සිට නඩත්තු කිරිමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන චක්‍ර ලේඛය | පරිගනක, පරිගනක උපාංග සහ මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන නොතිබුණි. | පරිගනක, පරිගනක උපාංග සහ මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර යාවත්කාලීන කිරිමට අවශ්‍ය ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේ සිට නඩත්තු කිරිමට කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | | |
| (i) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ පැමිණීමේ ලේඛනය පවත්වාගෙන නොතිබුණි. | මෙම කමිටු රැස්වීම් දෙක සඳහා පැමිණීමේ ලේඛනය අඛණ්ඩව නඩත්තු කිරිමට අවශ්‍ය ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේ සිට නඩත්තු කිරිමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය | ලංසු කැඳවීමේ ලේඛන ලියාපදිංචි තැපැලෙන් සැපයුම්කරුවන්ට නොයවා වෙළෙඳපොල මිල සැදැහුම් ක්‍රමය උපයෝගි කර ගනිමින් සැපයුම්කරුවන් | අදාල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව මිලදී ගැනීම් සභාව විසින් සිදු කර තිබිය යුතුවේ. | ඉදිරියේදි උක්ත සඳහන් අඩුපාඩු සිදුනොවන ආකාරයෙන් කටයුතු කිරිමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | 07දෙනෙකුගෙන් එකතුව රු.651,618ක් වටිනා කාර්යාල උපකරණ, යන්ත්‍රෝපකරණ, පවිත්‍රතා සහ වාහන අළුත්වැඩියා සේවාවන් වෙනුවෙන් සෘජුව සැපයුම්කරුවන්ගෙන් අදාල ලංසු ලේඛන ඉදිරිපත් කර මිලගණන් ලබාගත් අවස්ථා 15ක් විගණනයේදි නිරීක්ෂණය විය. | | |
| (iii) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | ලංසු කැඳවීමේ ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. | ලංසු කැඳවීමේ ලේඛනය අඛණ්ඩව නඩත්තු කිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේ සිට නඩත්තු කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 28,361,154 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 25,295,430 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 587,500 | 367,360 | 367,360 | - | 442,500 | 441,223 | 441,223 | – |
| (ii) | කුලී | 16,642,000 | 16,787,207 | 16,642,430 | 316,861 | 17,402,500 | 16,761,854 | 16,761,854 | – |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,894,650 | 2,134,340 | 2,134,340 | - | 1,541,400 | 2,328,704 | 2,328,704 | – |
| (iv) | වෙනත් ආදායම් | 29,727,420 | 29,142,232 | 36,868,331 | 15,792,729 | 23,860,040 | 28,752,963 | 28,752,963 | 23,518,828 |
| | එකතුව | 48,851,570 | 48,431,139 | 56,012,461 | 16,109,590 | 43,246,440 | 48,284,744 | 48,284,744 | 23,518,828 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පැවැති හිඟහිටි ආදායම් එකතුව රු.16,036,091ක් විය. ඉන් 2019 ජනවාරි 01 දිනට පැවැති හිඟහිටි ආදායම් එකතුව රු.23,036,912ක් සමාලෝචිත වර්ෂය සඳහා සම්පූර්ණ බිල් කළ ආදායම රු.48,431,139ක් සහ සමාලෝචිත වර්ෂයේ රැස්කළ මුළු ආදායම ආදිය සසඳා පරික්ෂා කර එහි සත්‍ය හා නිවැරදිභාවය සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂවලත් ගිණුම් ප්‍රකාශනවල දක්වා තිබූ ආරම්භක හිඟහිටි ආදායම්, ලැයිස්තුගත කළ ආදායම්, රැස්කළ ආදායම් සමග සසඳා නිවැරදි කිරීමේදි අවසාන හිඟහිටි ආදායම් ලැබී නොතිබීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස පිළිගෙන තහවුරු කළ නොහැකි විය. | සමාලෝචිත වර්ෂය අවසානයේදි අයකර නොමැතිව පවතින හිඟහිටි ආදායම් සැසඳීමට හැකි අයුරින් ගිණුම් සැකසීය යුතු අතර මූල්‍ය ප්‍රකාශනවලද එම වටිනාකම ඉදිරියට ගෙන ඒමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2019 වර්ෂය සඳහා වූ පුනරාවර්තන ආදායම, රජයේ බදු සහනාධාර ඇතුළත්ව රු.85,574,281.24ක් වේ. ඉන් 2019.12.31 දින වන විටත් අයකර නොමැතිව පවතින ආදායම් රු.12,787,279.02ක් (රජයේ බදු සහනාධාර නොමැතිව) වේ. මෙයින් රු.144,777.04ක් ප්‍රවර්තන වර්ෂයේදි අයකර තිබුණි. ඉතිරි රු.12,787,279.02ක් ලබා ගැනීම සම්බන්ධයෙන් අදාල කාර්යාල වෙත ලිපි යවා ඇත. ප්‍රවර්තන වර්ෂයේ දි මෙම මුදල් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. තවද, 2018 වර්ෂය සඳහා වූ ආදායම රු.20,368,600.61ක් (රජයේ බදු සහනාධාර නොමැතිව) 2019 වර්ෂයේදි ලබාගෙන තිබුණි. 2017 වර්ෂයේ වවුනියාවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු විස්තර නියමිත කාලපරිච්ඡේදයේ අප වෙත නොලැබීම හේතුවෙන් අදාල වර්ෂයන්හි ගිණුම්වල රු.3,896,184.60ක් ආදායම් ලෙස දක්වා නොතිබුණි. එම වටිනාකම පසුගිය ජනවාරි මාසයේ ලැබී තිබූ අතර ප්‍රවර්තන වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ ආදායම් ලෙස දක්වා ඇත. |

### 2.2.2 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමයන් ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ විදුලි සංදේශ කුළුණු 11 ක් සම්බන්ධයෙන් සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම, මූලික සැලසුම් අනුමත කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම සහ අධීක්ෂණ අනුමැතිය ලබාදීම යන සතර ආකාරයේ ගාස්තු අයකර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර එවැනි ගාස්තුවල එකතු කළ වටිනාකමද තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබුණි. | සභාව සතු හිඟ ආදායම් ගණනය කර අයකිරිමටත් වාර්ෂිකව එම ගාස්තු අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමටත් ඒවා සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමටත් සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | උක්ත සඳහන් කළ විදුලි සංදේශ කුළුණු නැවත පදිංචි කිරීමේ කාල පරිච්ඡේදයට පෙර හමුදා කඳවුරු තුළ ඉදිකර තිබූ නිසා අයකළ නොහැකි විය. කෙසේ වෙතත්, එයට සම්බන්ධිත සමාගම් වෙත ලිපි යවා ඇත. ප්‍රවර්තන වර්ෂයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමයන් ප්‍රකාරව ගාස්තු අය කරනු ලැබේ. |

### 2.2.3 උසාවි දඩ මුදල් මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.12,949,400ක උසාවි දඩ මුදල් සහ රු. 2,843,330ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් නියමිත කාලයේදි ලබාගැනීම සඳහා සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2019 දෙසැම්බර් 31 දිනට හිඟහිටි රු.15,792,730ක් ලබාගැනීම සම්බන්ධයෙන් නියමිත කාර්යාලවලට ලිපි යවා ඇත. ප්‍රවර්තන වර්ෂයේ මේවා ලබා ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. 2020 මැයි 29 දින රු.1,356,993ක මුද්දර ගාස්තු උතුරු පළාත් භාණ්ඩාගාරයෙන් ලබා ගෙන ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් සහ ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අපේක්ෂා කළ නිමැවුම් අත්කර කරගැනීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් මාර්ග 11 ක් ප්‍රතිසංස්කරණ කාර්යයන්වල කාර්යසාධනය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.9,703,439 ක් සුළු ණය හිමියෝ ගිණුමට ප්‍රතිපාදන සලසා වියදම් ලෙස දක්වා තිබුණත් අපේක්ෂා කළ මට්ටමේ නිමැවුමක් ළඟා කරගැනීමට සභාවට මේ දක්වා නොහැකිව තිබුණි. | සභාවේ වාර්ෂික අයවැය සැලැස්ම සහ වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම ආදිය ඵලදායි අන්දමින් සකස් කර එයට අනුකූලව ව්‍යාපෘති නියමිත කාලයේ අවසන් කිරීමට සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | එකතුව රු.2,807,030ක් වටිනා ව්‍යාපෘති 05ක් නිම කර ඇත. ව්‍යාපෘති 04ක කාර්යයන් ජූනි මාසය අවසන් වන විට අවසන් කිරීමට නියමිතය. එක් ව්‍යාපෘතියක අනුමැතිය ලබාගැනීමේදී කාල ප්‍රමාදයක් සිදුවිය. |

#### (ආ) අපේක්ෂා කළ ප්‍රතිඵල අත්පත් කරගැනීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් 02 ක් සඳහා රු.10,571,160 ක් වැය කර | එම ව්‍යාපෘති සඳහා උපයෝජනය කළ මුදලට අදාලව අපේක්ෂා කළ ප්‍රතිඵල | උන්නාප්පිලවු ළමා උද්‍යානය ඉදිරියේදී ආපන ශාලාවක් බවට පත්කිරීමට සැලැසුම් කර ඇත. |

| | | |
|---|---|---|
| අපේක්ෂා කළ නිමැවුම් ළඟා කරගෙන තිබුණද, එමඟින් ළමා විනෝදාස්වාදය සහ අලෙවිකරණය වැනි අපේක්ෂා කළ ප්‍රතිඵල පසුගිය වර්ෂ 04 සිට 05 ක් දක්වා ළඟා කරගෙන නොතිබුණි. | ළඟාකර ලැනීමට අවශ්‍ය ඵලදායි ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුවේ. | සතිපොළ ගොඩනැගිල්ලෙහි කඩකාමරයක් පවත්වා ගෙන යාමටද සැලසුම් කර ඇත. |

(ඇ) **තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2030 වර්ෂයේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සභාව විසින් ළඟා කර ගත යුතු ඉලක්ක සහ එම ඉලක්ක ළඟාකර ගැනීමේදි පවතින පරතරය මෙන්ම ඉදිරි ක්‍රියාකාරකම් මැනීම සඳහා සුදුසු දර්ශකයන්ද 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව පසුගිය වර්ෂ 02ක සිට සකස් කර නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක සකස් කර එමගින් වාර්ෂික ඉදිරි ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහා දර්ශකත් ස්ථාපිත කිරිමට සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග කඩිනමින් ගතයුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

(අ) **තනතුරු පුරප්පාඩු සහ අතිරික්තයන්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවට අදාළ තනතුරු පුරප්පාඩු 14 ක් පුරවා නොතිබීම නිසා එවැනි පාර්ශවයන් විසින් ක්‍රියාත්මක කළ යුතු සභාවේ කාර්යයන්, සංවර්ධන සැලැසුම් වැඩසටහන්වලදී ප්‍රමාදවීම් සිදු වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | මෙම කාර්ය මණ්ඩලය උචිත ක්‍රියාමාර්ගවලින් ලබා ගැනීම සඳහා සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | කාර්ය මණ්ඩලය නැවත පත්කිරිම සඳහා වූ ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |
| (ii) | ප්‍රාථමික මට්ටමේ නිලධාරි තනතුරෙහි ආයුර්වේද ඖෂධ කලවම්කරන්නෙකු අනුමත සේවක සංඛ්‍යාවට වඩා වැඩියෙන් බඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | සභාව විසින් නියමිත පරිදි අන්තර්ග්‍රහනය කිරීමට කටයුතු කළ යුතුවේ. | උතුරු පළාත්, පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියට අනුකූලව අදාල නිලධාරියා වෙනුවෙන් අතිරික්ත සේවක පදනමින් නැවත පත්වීම් ලබාදී තිබුණි. |

(ආ) සේවක ණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සේවයෙන් ඉවත් වූ, මියගිය සහ ස්ථාන මාරුවීම් ලබාගිය සේවකයන් 07 දෙනෙකුගේ හිඟ සේවක ණය එකතුව රු.658,278 ක් පසුගිය වර්ෂ 11 ක් තිස්සේ අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ආයතන සංග්‍රහයේ XXV පරිශිෂ්ඨයේ 4 වගන්තියේ 4.2.4 උපවගන්තිය ප්‍රකාරව කටයුතු නොකර අඛණ්ඩව හිඟ හිටව පැවතුණි. | ආයතන සංග්‍රහයේ XXV පරිශිෂ්ඨයේ 4 වගන්තියේ 4.2.4 උපවගන්තිය ප්‍රකාරව සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග නියමිත කාලයේදි ගත යුතු වේ. | අදාල හිඟහිටි ණය සම්බන්ධිත ලේඛන නොමැති විමෙන් උතුරු පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව පවතී. |
| (ii) | වෙනත් කාර්යාලවලට ස්ථාන මාරු වීම් ලබාගිය සේවකයන් තිදෙනෙකුගේ හිඟහිටි ආපදා ණය ශේෂ එකතුව රු.137,167 ක් අය කරගැනීමේ ක්‍රියාමාර්ග පසුගිය වර්ෂ 03 සිට වර්ෂ 05 ක් පුරා මන්දගාමී තත්ත්වයක පැවතුණි. | කාර්ය මණ්ඩල හිඟ හිටි ණය සම්පූර්ණයෙන් ගෙවීමේ ඉල්ලීම සම්බන්ධිත දෙපාර්තමේන්තු ප්‍රධානියාට ඉදිරිපත් කිරිමට සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | හිඟහිටි ණය වාරික වශයෙන් අඛණ්ඩව ගෙවීම් කරමින් පවතී. |
| (iii) | සේවකයින් 03 දෙනෙකුගේ එකතුව රු.191,946 ක් වටිනා සේවක ණය මාසික වාරික මුදල් වර්ෂ 02 සිට 03 දක්වා අය කරගැනීමට කටයුතු කර නොතිබු බව නිරික්ෂණය විය. | ණය වාරික සහ ඒ සඳහා පොළි එකතුව නියමිත පරිදි අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. | හිඟණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. |

3.3 මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙන් වෙන්වූ අලුත්වැඩියා සහ ප්‍රතිසංස්කරණ කාර්යයන් දෙකක් සඳහා කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසයේ එකතුව රු. මිලියන 2.5ක් සභාවේ අරමුදලින් අත්තිකාරම් ගෙවා තිබුණි. මෙම අත්තිකාරම් 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබු බව විගණනයේදි නිරික්ෂණය විය. | සභාවේ අරමුදලින් ක්‍රියාත්මක නොකළ කාර්යයන් සඳහා සභාවේ අරමුදලින් ගෙවීම් කිරිම වැලැක්විය යුතුවේ. | පළාත් සභාවෙන් අරමුදල් නොලැබීම හේතුවෙන් නිරවුල් නොකර තිබූ නමුත් ප්‍රවර්තන වර්ෂයේදි නිරවුල් කර ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවට පරිත්‍යාග කර තිබූ වාහන 03ක් පසුගිය වර්ෂ 04ක සිට භාවිතා නොකර ගබඩාවේ තිබූ බව නිරීක්ෂණය විය. | අලුත්වැඩියා කළ යුතු වාහන නියමිත කාලයේ අලුත්වැඩියා කර භාවිත තත්ත්වයට පත්කිරීමට සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගතයුතු වේ. | වාහන අලුත්වැඩියා කිරිමට උතුරු පළාත් යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ අනුමැතිය ලබාගෙන ඇති අතර අලුත්වැඩියා කිරිමට ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. මෝටර්රථ ලියාපදිංචි පොත් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | සභාව විසින් භාවිතා නොකරනු ලබන පරිගනක සහ ඡායා පිටපත් යන්ත්‍ර සඳහා මිලදී ගත් එකතුව රු.89,450 ක් වටිනා ටෝනර් 13ක් පසුගිය වර්ෂ තුනක කාලයක් භාවිතයකින් තොරව ගබඩාවේ රඳවා තිබුණි. | තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් පරීක්ෂා කර එය භාවිතා කිරිමට සුදුසු ආකාරයට සැපයීම හෝ අතිරික්ත තොග හා හානිවීම් සඳහා හේතු හඳුනාගෙන කටයුතු කළ යුතු වේ. | භාවිතා නොකරනු ලබන ටෝනර් වෙනත් කාර්යාල වෙත භාවිතා කිරීම සඳහා ලබාදීමට ක්‍රියාමාර්ග ගනිමින් පවති. |

### 3.4.2 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව සභාවේ මුලතිව්, මුල්ලියවායික්කාල් සහ සෙම්මලෙයි උප කාර්යාල වල පුස්තකාල පොත් 180 ක ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා හේතු සහ ඉදිරි ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන නොතිබුණි. | එම ඌනතාවය හිලවු කිරිම සඳහා වූ ඵලදායි ක්‍රියාමාර්ග මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව ගත යුතු වේ. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රකාරව හිඟව පැවැති පොත්වල වටිනාකම අදාල නිලධාරීන්ගෙන් අයකරගෙන ඇත. |

### 3.4.3 වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) රජය සහ රජයේ නොවන ආයතනවලින් ලබාදි සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 10 ක් සඳහා වාහන ලියාලදිංචි කිරීමේ පොත් ලබාගැනීමට පසුගිය වර්ෂ 08ක කාලයක සිට ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාහන ලියාපදිංචි පොත් ලබාගෙන නොමැතිව සභාව විසින් භාවිතා කරමින් පවතින වාහන සඳහා ලියාපදිංචි කිරීමේ පොත් ලබාගැනීමට සභාව විසින් කඩිනමින් ක්‍රියාමාර්ග ගතයුතු වේ. | වාහන හතරකට මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් වාහන ලියාපදිංචි කිරීමේ වාර්තාව ලබාගෙන ඇත. තවත් වාහනයකට ලියාපදිංචි කිරීමේ සහතික කළ පියපත් ලබාගෙන ඇත. අනෙකුත් වාහන හතර සඳහා ලේඛන ලබාගැනීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ii) රජය සහ රජයේ නොවන ආයතන විසින් සභාවට පරිත්‍යාග කරනු ලැබූ වාහන 03ක අයිතිය සභාවේ නමට මාරුකිරිමට කටයුතු නොකර පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 07ක් දක්වා වූ කාලයක් සභාව විසින් භාවිතා කරමින් පැවතුණි. | නැති වූ ට්‍රැක්ටරයේ පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුවේ. එසේම, සභාවට සතු නොවන අනෙකුත් වාහන දෙකද නිසි කාලපරිච්ඡේදය තුළ සභාවේ නමට මාරු කිරිමට ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ලියාපදිංචි අංක WPRB4169 දරන ට්‍රැක්ටරය 2013 වර්ෂයේදි නැති වූ අතර අංක LG 3500, LG 3506 දරන වාහනවල අයිතිය මාරු කිරිමට කටයුතු කරනු ලැබේ. |

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 සැපයුම් හා සේවාවන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) 2019 පෙබරවාරි 01 දිනැති සභාවේ ප්‍රසම්පාදන කමිටු තීරණය ප්‍රකාරව කැනොන් වර්ගයේ පරිගනක මුද්‍රණ යන්ත්‍රයක් රු.18,400ක් බැගින් යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම වෙනුවට යන්ත්‍ර තුනක් සැපයුම්කරුවකුගෙන් මිලදි ගෙන තිබූ බව විගණනයේදි නිරීක්ෂණය විය. ඒ අනුව සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය රහිතව රු.18,400කට මුද්‍රණ යන්ත්‍රයක් අමතරව මිලදී ගෙන තිබුණි. | අවශ්‍යතාවයට අධිකව සිදුකරන මිලදි ගැනීම් වලක්වා ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරි කාලයේදි ඉහත සඳහන් වැරදි සිදුවීම වැලැක්වීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ii) සභාවේ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය නොමැතිව එකතුව රු.225,421කට පරිගනක හා මුද්‍රණ පිටපත් යන්ත්‍ර සඳහා ටෝනර් 16ක්, සිවිලිං විදුලිපංකා සහ ලිපිද්‍රව්‍ය ආදි අයිතමයන් ශ්‍රී ලංකා රාජ්‍ය | සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ විධිමත් අනුමැතිය ලබා භාණ්ඩ මිලදි ගැනිම සිදු කළ යුතුවේ. එසේම, තාක්ෂණික ඇගැයීමට ලක්කර මිලදි ගත යුතු | ඉදිරි කාලයේදි ඉහත සඳහන් වැරදි සිදුවීම වැලැක්වීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| | | |
|---|---|---|
| වානිජ විවිධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගෙන තිබූ අවස්ථා 05ක් විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මෙවැනි ටෝනර් සහ උපකරණ පිළිබඳ තාක්ෂණික ඇගයීම් කිරීමද විධිමත්ව පත්කළ යුතු සභාවේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පරිශීලනය කර තිබූ බවට නිර්දේශයන් විගණනයට ලැබී නොතිබුණි. | අයිතමයන් සඳහා එලෙස තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබාගැනීමෙන් පසුව සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ප්‍රකාරව මිලදී ගැනීමටත් සභාව විසින් එලදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු කර තිබූ වැඩසටහන්වලින් මූලධන වැඩසටහන් 07 ක් ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි. ඉන් වැඩසටහන් 06ක වටිනාකම ඇස්තමේන්තු නොකර ඇතුළත් කර තිබුණි. | සභාවේ වාර්ෂික අයවැය සැලැස්මේ ඇතුළත් කරනු ලබන වැඩසටහන්වල වටිනාකම සුදුසු පරිදි තක්සේරු කර ඇතුළත් කළයුතු අතර මහජනය දැනගැනීම පිණිස ඉදිරිපත් කර අනුමත කර තිබෙන අයවැය වෙනස්කම් එලෙස ක්‍රියාත්මක කිරීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. | මහවැලි සංවර්ධන සැලැසුම්වල ඇතුළත් කරනු ලැබූ වැඩසටහනක් සඳහා අනුමැතිය මේ දක්වා ලැබී නොතිබුණි. අනෙකුත් වැඩසටහන් 06 වෙනුවට වෙනත් මාර්ග ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමට තීරණය කර, මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. |
| (ii) | සමාලෝචිත වර්ෂය සඳහා වූ සභාවේ අයවැය සැලැස්ම නිවැරදි ඇස්තමේන්තු කිරීම්වලට අනුකූලව සැලැසුම් කර සකස් නොකිරීම නිසා වර්ග 04ක ඇස්තමේන්තුගත වියදම් සහ තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයන් පිළිවෙලින් සියයට 16.4 සිට සියයට 61ක් දක්වා ප්‍රමාණයක් සහ වර්ග 04ක ඇස්තමේන්තුගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර වාසිසහගත සහ අවාසිසහගත විචලනයන් පිළිවෙලින් සියයට 7 සිට සියයට 37.5ක් දක්වා පැවතුණි. | සභාව විසින් සුදුසු මූලිකාංගයන් සැලකිල්ලට ගෙන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි අයවැය සැලැස්ම සකස්කර මහජනතාවගේ එකඟතාවයට ඉදිරිපත් කර ඒවා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට එලදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරි වර්ෂවලදී නිවැරදි ක්‍රමවේදයක් මාර්ගයෙන් සකස්කිරීම මගින් විචලනයන් වලක්වනු ලැබේ. |
| (iii) | 2015 සිට 2019 දක්වා කාලපරිච්ඡේදයේ මූලධන වැඩසටහන් 106ක් ඉටුකිරීම සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කර ඒවා සභාව විසින් අනුමත කර | සභාව විසින් අදාල වර්ෂයේ සභාවේ අරමුදලින් ක්‍රියාත්මක කරන වැඩසටහන් පමණක් වාර්ෂික අයවැය සැලැස්මෙහි ඇතුළත් කර ජනතාවගේ | PSDG, CBG කාර්යයන් සඳහා ප්‍රතිපාදන ලැබී නොතිබුණි. වැඩසටහන් 08ක් වෙනත් වැඩසටහන්වලට අන්තර්ග්‍රහනය කර ක්‍රියාත්මක කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. නමුත් එකතුව රු. මිලියන 72.1ක් වටිනා මූලධන වැඩසටහන් 31ක් ක්‍රියාත්මක නොකර පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 05ක කාලයක් සම්පූර්ණයෙන් අත්හැර දමා තිබුණි. | එකඟතාවය සහිතව ප්‍රයෝජනවත් අයුරින් ඉටුකළ හැකි පරිදි ශක්‍යතා අධ්‍යයනයන් සිදු කර නියමිත කාලයේ නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ගයන් ගත යුතුවේ. | වැඩසටහන් 03ක් ආදායම් නොලැබීම නිසා ක්‍රියාත්මක කර නොතිබුණි. මාර්ග වැඩසටහන් 05ක් වෙනුවට වෙනත් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. වැඩසටහන් 02ක 2020 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි. |
| (iv) | සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තු ප්‍රකාරව එකතුව රු.මිලියන 18.38ක ඇස්තමේන්තුගත වියදමින් මාර්ග 21ක් ප්‍රතිසංස්කරණයන් සභාව විසින් අනුමත කර තිබුණි. නමුත්, එවැනි මාර්ග සෑම එකක් සඳහාම පූර්ව ඇස්තමේන්තු කිරීම් වෙන වෙනම තක්සේරු කර අයවැය සකස් නොකිරීම නිසා මෙම මාර්ග සියල්ලෙහිම වටිනාකම විගණනයේදී සතුටුදායක ලෙස පිළිගෙන පරීක්ෂා කළ නොහැකි විය. | සභාවේ වාර්ෂික අයවැය සැලැස්මේ අන්තර්ගත කර ඇති සෑම මූලධන වැඩසටහනක් සම්බන්ධයෙන්ම වෙන වෙනම පූර්ව ඇස්තමේන්තු කිරීම් වෙන වෙනම සිදුකර ඇස්තමේන්තු කළ වටිනාකම් අන්තර්ගත කර එය පදනම් කරමින් අයවැය ක්‍රියාකාරකම් නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2019 අයවැය සැලැස්මේ මාර්ග 21ක් ප්‍රතිසංස්කරණය සඳහා සැලසුම් කර තිබුණි. එසේ වුවත්, සභාවේ මූල්‍ය ප්‍රතිපාදන හේතුවෙන් ඒවා වැඩසටහන් 13ක් බවට වෙනස් කිරීමට සිදුවිය. මේ නිසා තීරණ අංක 107/18.07.19 අනුව සභාවේ අනුමැතිය ජූලි මාසයෙන් පසුව ලැබීම හේතුවෙන් ප්‍රජාමූල සංවිධාන සඳහා ගිවිසුම් ඉන්පසුවම ඉටුකර තිබුණි. එසේම, ඇතැම් වැඩසටහන් ගම්පෙරලිය වැඩසටහන තුළට ඇතුළත් කිරීම නිසා ඒ වෙනුවට වෙනත් වැඩසටහන් තෝරා ඇස්තමේන්තු සකස්කිරීමට සිදුවීම නිසා මේවා සඳහා ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල ගිවිසුම්වලට එළැඹීමට සිදුවී තිබුණි. |

## 4.2 අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ කටයුතු විගණනය කර කාර්යක්ෂමව ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද, අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා පසුගිය දෙවර්ෂය සඳහා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා සකස් කිරීමට කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ඇත. එයට අනුකූලව ප්‍රවර්තන වර්ෂයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සහ විගණන පරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. |